# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## තෙවන වාර පරීක්ෂණය - 2018

| ඉන්දියා ඉතිහාසය | 12 ශ්‍රේණිය | කාලය පැය තුනකි |
|---|---|---|

**නම: .............................................................................**

## I කොටස

- අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

1) i. උපනිෂද් ii. බ්‍රාහ්මණ iii. ආරණ්‍යක
iv. වායුපුරාණය v. සංහිතා (......................)

2) i. ජේලම් ii. රාවි iii. ගුමාල්
iv. බියස් v. චේනාබ් (......................)

3) i. සුප්පාරක ii. චන්හුදාරෝ iii. හරප්පා
iv. කොට්ඩිජි v. මොහෙන්ජොදාරෝ (......................)

4) i. අග්නි ii. ගංගා iii. පෘථිවි
iv. බ්‍රහස්පති v. ඉන්ද්‍ර (......................)

5) i. මල්ල ii. කෝසල iii. මගධ
iv. වත්ස v. අවන්ති (......................)

6) i. ශිශුනාග ii. නන්ද iii. මෞර්ය
iv. හර්යංක v. පුෂ්‍යමිත්‍ර (......................)

7) i. සුලෙයිමාන් ii. ථාර් කාන්තාරය iii. හින්දුකුෂ්
iv. රාජ්මහල් v. කිර්තාර් (......................)

8) i. ෆාහියන් ii. තාරානාථ iii. සංයුං
iv. ඉට්සිං v. හියුං-සාං (......................)

9) i. පූර්ණ කස්සප ii. පකුධ කච්චායන iii. මක්ඛලී ගෝසාල
iv. අජිත කේසකම්බල v. ගෞතම බුද්ධ (......................)

10) i. පුරෝහිත ii. සේනානි iii. සමිති
iv. අක්ෂාවාප v. භාගදූග (......................)

❖ අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11) i. තාරානාථ - චීන
ii. හෙරඩෝටස්- ග්‍රීක
iii. අල්බිරූනි - අරාබි
iv. කොස්මස් - බයිසන්තියන්
v. ස්ට්‍රාබෝ - රෝම (..................)

12) i. වජ්ජි - වෛසලි
ii.වත්ස - කෞෂාම්බි
iii. අංග - චම්පා
iv. කුරු - පංචාල
v. සූරසේන - මථුරා (..................)

13) i. යම - මරණයට අධිපති
ii. පෘථිවි - පොළවට අධිපති
iii. උෂා - උදෑසනට අධිපති
iv. සෝම - සඳු දෙවියා
v. වරුණ - මේඝ ගර්ජනාවට අධිපති (..................)

14) i. රූපාර් - සත්ලෙජ්
ii. කලිබංගන් - ගග්සර්
iii. මොහෙන්ජෝදාරෝ - සින්ධු
iv. හරප්පා - රාවි
v. ලෝතාල් - සුවාස්තු (..................)

15) i. භාගදුග - භාණ්ඩාගාරික
ii. පුරෝහිත - රජුගේ උපදේශක
iii. අක්ෂාවාප - දුර්ගපාලක
iv. උග්‍ර - පොලිස් නිලධාරි
v. සේනානි - සෙන්පතිවරයා (..................)

❖ අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නයක් සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම/ප්‍රකාශන/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තිරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා තිත් ඉර මත ලියන්න.

16)

| X | Y |
|---|---|
| i. සෝම | A. වැඩිහිටියන්ගේ රැස්වීම |
| ii. සභා | B. නේෂාද කුලයේ කොටසකි. |
| iii. ගවානිස් | C. දිව්‍යමය පානයකි. |
| iv. සති | D. ඡත්‍ර දරන්නා. |
| v. ක්ෂත්‍ර | E. වැන්දඹුවන් දර සෑයට පැන යෑම. |

i. ECABD ii. BACED iii. ACBDE iv. CABED v. DCABE

(...................)

17)

| X | Y |
|---|---|
| i. චතුර්ආශ්‍රම | A. සාම, දාන, භේද, දණ්ඩ |
| ii. චතුර්වර්ණ | B. බ්‍රහ්මචාරී, ගෘහස්ථ,වානප්‍රස්ථ,සන්‍යාසී. |
| iii. චතුර්වේද | C. දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග. |
| iv. චතුර්සත්‍ය | D. බ්‍රාහ්මණ, ක්ෂත්‍රීය, වෛශ්‍ය, ශූද්‍ර. |
| v. චතුර්උපාය මාර්ග | E. ඍග්, යජුර්, සාම, අථර්වන්. |

i. BDECA ii. DBEAC iii. CDEBA iv. BECDA v. ABDEC

(...................)

18)

| X | Y |
|---|---|
| i. කාලිදාස | A. අර්ථශාස්ත්‍ර |
| ii. මෙගස්තිනීස් | B. රත්නාවලී |
| iii. වාල්මිකි | C. මේඝදූත |
| iv. හර්ෂවර්ධන | D. ඉන්ඩිකා |
| v. කෞටිල්‍ය | E. රාමායනය |

i. BCDAE ii. ECDBA iii. DECBA iv. ACBDE v. CDEBA

(....................)

19)

| X | Y |
|---|---|
| i. රත්නින් | A. මහා බ්‍රහ්ම. |
| ii. ඉන්ද්‍ර | B. භූසුර. |
| iii. මුදල් | C. මේඝ. |
| iv. බ්‍රාහ්මණ | D. රාජකර්ණං |
| v. ප්‍රජාපති | E. නිෂ්ක |

i. DCEBA ii. CDEBA iii. BDCEA iv. ACDBE v. EDCBA

(....................)

20.

| X | Y |
|---|---|
| i. මෝරියවරු | A. රාමාගම |
| ii. මල්ලයෝ | B. මිථිලා |
| iii. විදේහයෝ | C .වෛශාලි |
| iv. කෝලියෝ | D. පාවා |
| v. ලිච්ඡවිහූ | E. පිප්ඵලිවන |

i. DEBAC ii. BACED iii. EDBAC iv. AEDBC v. CABED

(....................)

❖ අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**21)** මගධ රාජ්‍යය පාලනය කළ රාජවංශ අනුපිළිවෙලින් දැක්වෙන්නේ පහත දැක්වෙන කවර ලැයිස්තුවේ ද?

i. ශිශුනාග, හර්යංක, නන්ද, මෞර්ය.

ii. හර්යංක, නන්ද ශිශුනාග, මෞර්ය.

iii. ශිශුනාග, හර්යංක, මෞර්ය, නන්ද.

iv. හර්යංක, ශිශුනාග, නන්ද, මෞර්ය.

v. නන්ද, හර්යංක, ශිශුනාග, මෞර්ය. (....................)

**22)** ධාන්‍යාගාරයක නටබුන් හමු වූ හරප්පා නගරය කුමක්ද?

i. මොහෙන්ජොදාරෝ ii. හරප්පා. iii. කලිබංගන්

iv. රඛිගාර්හි v. චන්හුදාරෝ (..................)

**23)** සංගම් සාහිත්‍යය වර්ධනය වූයේ කුමන රජුන් යටතේ ද?

i. චේර ii.චාලුක්‍ය iii. පාණ්ඩ්‍ය

iv. පල්ලව v. සාතවාහන (..................)

**24)** හියුං - ත්සාං හිමි ඉගෙනගත් විශ්ව විද්‍යාලය කුමක්ද?

i. වලභි ii. තක්ෂිලා. iii. ඕදන්තපුරි

iv. වික්‍රමශිලාව v. නාලන්දා (..................)

**25)** භාරුකච්ඡවලින් මුහුදට ගලා යන ගංගාව කුමක් ද?

i. තප්ති ii.ක්‍රිෂ්ණ iii. ගෝදාවරී

iv. නර්මදා iv මහා නදී(..................)

❖ අංක 26 සිට 30 තෙක් සෑම ප්‍රශ්නයක ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

**26)** ඉන්දියානු ඉතිහාසය පිළිබඳ වැදගත් විදේශීය මූලාශ්‍ර,

i. අරාබි වාර්තා. ii. ග්‍රීක වාර්තා iii. චීන වාර්තා

iv. ටිබෙට් වාර්තා v. ජෛන වාර්තා (.................)

**27)** වර්ණ ධර්ම අනුව,

i. බ්‍රාහ්මණයන්ට සමාජයේ ඉහළම තැන ලැබේ.

ii. ශුද්‍ර යනු ද්විජයන්ය.

iii. ද්වීජ බවට පත්වන්නේ උපනයනයෙන් පසුවය.

iv. ශුද්‍රයා අනුන්ගේ බැලමෙහෙවර කළ යුතුය.

v. ක්ෂත්‍රියන්ගේ අනිවාර්ය කාර්යය ප්‍රජා පාලනයයි. (................)

**28)** හරප්පා වැසියන්ගේ සමාජ ජීවිතය,

i. මාතෘ මූලික සමාජ ක්‍රමයක් පැවත ඇත.

ii. එහි වැසියෝ බාර්ලි, වී, තිරිඟු, මෑ ආදී ධාන්‍ය වගා කළහ.

iii. ස්ත්‍රීහු මාල, වළලු, මුදු ආදී ආභරණ පැලැන්දාහ.

iv. පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව ප්‍රධාන මානව වර්ග හතරක් වාසය කොට ඇත.

v. ඉන්දු නිම්න වැසියෝ මෙසපොතේමියාවෙන් කපු ආනයනය කළහ. (..............)

**29)** මගධ රාජ්‍යයේ නැගීමට හා වර්ධනයට හේතු වූ සාධක

i. අගනුවර හා රාජධානියේ භූගෝලීය පිහිටීම.

ii. දක්ෂ පාලකයන් යටතේ හොඳින් සකස් වූ හමුදාව.

iii. අසල්වැසි ගණ රාජ්‍යවලින් ලැබුණු සහාය.

iv. කෘෂිකර්මයේ හා වෙළෙඳාමේ වර්ධනය.

v. සම්පත්වලින් ආඪ්‍ය වීම. (................)

**30)** බෞද්ධ හා ජෛන ඉගැන්වීම් අතර ඇති සමානකම්

i. වෛදික ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීම.

ii. නිර්වාණය පිළිබඳ විශ්වාසය.

iii. කුලභේද සමාජය පිළිනොගැනීම.

iv. අත්ථකිලමතානු යෝගය පුහුණු කිරීම.

v. අවිහිංසාව පිළිගැනීම. (.................)

❖ අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

(A)හා (B) පමණක් නිවැරදි නම් .................................................. 1 ද,

(B)හා (C) පමණක් නිවැරදි නම් .................................................. 2 ද,

(C)හා (D) පමණක් නිවැරදි නම් .................................................. 3 ද,

(A)හා (C) පමණක් නිවැරදි නම් .................................................. 4 ද,

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් **5** ද, වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A)හා (B) පමණක් නිවැරදිය | (B)හා (C) පමණක් නිවැරදිය | (C)හා (D) පමණක් නිවැරදිය | (A)හා (C) පමණක් නිවැරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ප්‍රමාණයක් නිවැරදිය. |

**31)** මගධ රාජ්‍යයේ පාලනය,

A. බිම්බිසාර රජු මගධයේ යුද්ධ සේනාවට ශිලා සණ්ඨාර නම් නවීන යුද්ධායුධ එක් කළේය.

B. සුනීධ, වස්සකාර මගධයේ සිටි වැදගත් නිලධාරීහු වේ.

C. රාජ්‍ය බලය ලබා ගැනීමට ක්ෂත්‍රිය කුල පදනම අවශ්‍ය නොවීය.

D. මගධයේ අගනුවර එක් අවස්ථාවකදී බරණැසට මාරු විය. (...................)

**32)** ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ

A. ගංගා යමුනා තැනිතලාව විශාල අධිරාජ්‍යවල මධ්‍යස්ථානය විය.

B. තප්ති නදිය පැහැදිලි ස්වාභාවික දේශසීමාවකි.

C. මහා කඳුවැටි වැදගත් වන්නේ ප්‍රධාන ගංගා දෙකක මූලය එම කඳුවැටි ආශ්‍රිතව වීමයි.

D. මක්රාන් දූර්ග මාර්ගය පහසුවෙන් ඉන්දියාවට පිවිසිය හැකි මඟයි. (................)

**33)** ඍග් වෛදික යුගයේදී ආර්යයන් හා ඉන්දු නිම්න වාසීන්ගේ වෙනස්කම්,

A. වෛදික ආර්යයන් හා ඉන්දු නිම්න වැසියන්ගේ මානව වර්ග වෙනස්ය.

B. ආර්ය සභ්‍යත්වය ග්‍රාමීය වූ අතර හරප්පා ශිෂ්ටාචාරය නාගරික ලක්ෂණවලින් යුක්තය.

C. හරප්පා වැසියන් නිර්මාංශ වූ අතර ආර්යයන් මාංශමය ආහාර පමණක් අනුභව කළහ.

D. හරප්පා වැසියන්ට යකඩ පිළිබඳ දැනුම තිබූ අතර ආර්යයන්ට ඒ දැනුම නොවීය. (................)

**34)** ක්‍රි.පු. 6 වන සියවසේ උතුරු ඉන්දියන් දේශපාලන තත්වය ,

A. ක්‍රි.පු. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ ජනපද සොළොසක් තිබූ බව අංගුත්තර නිකායේ දැක්වේ.

B. ජනපද අතර අරගලවලින් පසු ඉදිරියට පැමිණියේ ජනපද 6 කි.

C. මෙම ජනපද රාජාණ්ඩු හා සමූහාණ්ඩු ලෙස පාලනය විය.

D. අවසානයේ ජයග්‍රහණය කළේ කෝසල ජනපදයයි. (.................)

**35)** ඉන්දියාවේ බුදු දහම පරිහානියට පත්වූයේ,

A. රාජ්‍ය අනුග්‍රහය නොලැබීම නිසා.

B. මහායාන - හීනයාන නිකාය භේදය නිසා.

C. හින්දු පුනර්ජීවන ව්‍යාපාර නිසා.

D. හූණ ආක්‍රමණ නිසා. (................)

❖ අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා, ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදිය. |
| 2 | නිවැරදි ය. | නිවැරදිය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදිය. |
| 5 | නිවැරදි ය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මුද්‍රා වලින් එහි ජනතාවගේ ආගමික වත් පිළිවෙත් හෙළිදරව් වේ. | හරප්පා ශිෂ්ටාචාරය ලෝකයේ ඉපැරණි ශිෂ්ටාචාරවලින් එකක් ලෙස පිළිගැනේ. | (...............) |
| 37. | වජ්ජි සමූහාණ්ඩුව ප්‍රධාන ගෝත්‍ර හතරකින් සමන්විත විය | වජ්ජි සමූහාණ්ඩු ක්‍රි.පූ. හයවන සියවසේ දී ආර්යාවර්තයේ බලවත් ම රාජ්‍ය විය. | (...............) |
| 38. | පාටලීපුත්‍රයේ නගර පාලනය පිළිබඳ දීර්ඝ විස්තරයක් මෙගස්තීනිස් ඉදිරිපත් කරයි. | නගරයේ පාලන කටයුතු මණ්ඩල හයකට පවරා තිබුණු බවත් ඒ සෑම මණ්ඩලයක්ම සමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වූ බවත් ඔහු සඳහන් කරයි. | (...............) |
| 39. | වර්ධමාන විශාලා මහා නුවර ක්ෂත්‍රීය පවුලක පුත්‍රයෙකු විය. | මහාවීර යන නමින්ද වර්ධමාන හැඳින්වීය. | (...............) |
| 40. | අසෝක සෙල්ලිපිවල රටවල් නමයකට ධර්මදූතයන් යැවීම පිළිබඳව සඳහන් වේ. | මහින්ද හිමි ඇතුළු පිරිස ලංකාවට වැඩම කළ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. | (...............) |

## II කොටස

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
  (පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)

1) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කර නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

   i. බැරෝඩා.
   ii. සින්දු නදිය.
   iii. පාටලිපුත්‍ර.
   iv. තක්ෂිලා.
   v. සුලෙයිමාන්
   vi. උදේනි.
   vii. මහානදිය.
   viii. සුප්පාරක

2) වයඹදිග ඉන්දියාවේ දුර්ග මාර්ග නියමිත යුගයේ ඉතිහාසය හැදෑරීමට උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න.

3) ''හරප්පා සභ්‍යත්වය ලොව පැරණි නාගරික ශිෂ්ටාචාරවලින් එකකි.''
   i. හරප්පා ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශ පිළිබඳ කැණීම් කළ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)
   ii. මොහෙන්ජොදාරෝ හා හරප්පා නගර අසලින් ගලා යන ගංගා දෙක නම් කරන්න. (ල. 02)
   iii. හරප්පා වැසියන්ගේ ආර්ථික තොරතුරු කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)
   iv. ඉහත සඳහන් ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ල. 07)

4) වෛදික යුගයේ දේශපාලන තත්ත්වය පශ්චාද් වෛදික යුගය වන විට වෙනස් වන ආකාරය විස්තර කරන්න. (ල. 14)

5) මගධයේ නැගීමට බිම්බිසාර, අජාසත්ත රජුන්ගේ දායකත්වය ප්‍රමාණය කරන්න. (ල.14)

6) ක්‍රි.පූ. හයවන සියවසේ වර්ධනය වී පැවති නව ආගමික චින්තාවන් පිළිබඳව කරුණු දක්වන්න. (ල. 14)

7) ''මෞර්ය චන්ද්‍රගුප්ත ඉන්දියාවේ ප්‍රථම අධිරාජයා විය'' සාකච්ඡා කරන්න. (ල. 14)

8) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.

   i. සංගම් සාහිත්‍යය.
   ii. ගණ රාජ්‍යයන්.
   iii. අර්ධද්වීපික ඉන්දියාව.
   iv. අශෝක සෙල්ලිපි. (එක් කොටසකට ලකුණු 07 බැගින්)